

# පලුගස්වැව තරුණ ගොවි නවෝදය



ඩැපොග් තවාන් ගොයම් පැල

**1976** දී පලුගස් වැව ප්‍රදේශයේ රැකියා නොමැති උගත් තරුණ තරුණියන් ගොවි තැනට බැස්සා. පලුගස්වැව 'මහවැලි', වේර ගල 'ධාතුසේන' කුඹුක්වැව 'පැරකුම්', සේනා දිරියාගම, 'පුබුදු'. ගලපිටගල 'සමගි', උල් පත 'තිස්ස', දෙමුන්නැව 'අරුණ', හොරුවිල 'වාසනා', හබරණ 'ගාමිණී', හා පුවක්පිටිය තරුණ ගොවි සමාජය ඔවුන්ගේ සාමූහික සංවිධානයි.





වන්නිනායක ලේකම් මහත්තයා ප්‍රදේශයේ වී වගා 'සම්බන්ධිත ගොවියෙක්', පුතා පුංචි බණ්ඩා 'සමගි' සමාජයේ සභාපති. 'ඩැපොග්' තවාන් ක්‍රමය පුතාගෙන් ඉගෙන ගත්තේ. දූන් ගොවිගෙදර, පැලවලට ගිහින් ඩැපොග් ක්‍රමය කියාදෙන්නේ මෙයායි. තරුණ සමගිය හොඳයි. ගම් එකමුතුයි. හොර මැරකම් නැහැ. එයා කියනවා.

වී හා අතිරේක බෝග පිළිබඳ පුහුණුවක් ඔවුනට ලැබුණ. ගමේ කුඩා වැව් අසළ අක්කර පහ බැගින් එළිවුණ. වී ගොවිතැන් කළා. තමන් උගත් අළුත් වගා[illegible] වැඩිහිටි අයගේ කුඹුරුවල ශ්‍රමදානයෙන් කර ප්‍රදේශය පුරා පැතුරුවා. ආදයම් ග්‍රාමීය බැංකුවල එකිනෙකා නමින් තැන්පත් කළා. සමාජ එකතු වෙලා දූන් ඒකාබද්ධ තරුණ ගොවි මණ්ඩල යක් හදලා.

තරුණ ගොවිලියෝ දූන් මයියොක්කා කේක්, කට්ලට්, සෝයාබෝංචි කිරි, ජෑම්, ජාති වගේ කෑම බීම හදන්න මෙන්ම හණ බෑග් අළුත් මැහුම් ගෙතුම් වැඩට හරි දස්සියෝ.

මේ තරුණ ගොවි නවෝදයේ පසුපස සිටින්නේ කෘෂිකර්ම උපදේශක ඩබ්. ඇම්. පියදස මහතා බව ඔවුන් නොපැකිල පැව සුවේ කුළුණු බර හදවත් වලිනුයි.



පියදස මහතාගෙන් උපදෙස්



''සමගි'' සමාජයේ තරුණ ගෙවිලියන් පැල සිටුවද්දී

ට්‍රේලරය තබන්නේ. රෝද සුළං පුරවන ලද ටියුබ් සහ ටයර් වලිනුයි තනා ඇත්තේ කරත්තයට සවි කිරීමට කාර් එකකට සවි කරනවා වගේ ම අගුලක් තනා තිබෙනවා. එය ගැලවීමටත් සවි කිරීමටත් පහසු යි.

මේ ට්‍රේලරය නිසා බර බාගයෙන් ගන්නා වැඩ ප්‍රමාණය දෙගුණ තෙගුණ වුනත්, ගොන් බානට ඒ බර කෙළින්ම පැටවෙන්නේ නෑ.

(යෝජන සහරාව ජනවාරි77)

## එළ හරකයි මී හරකයි එක් කරන්න බැරිද?

කොලම්බස් ඇමරිකාවට ගොඩ බහින කාලයේ ඒරටේ 'බිසන්' වර්ගයේ මී හරකුන් දශ ලක්ෂ 30 ක් පමණ සිටින්නට ඇතැයි අස්තමේන්තු කර තිබේ. එහෙත් අවුරුදු පණහකට ඉහත දී ඉතුරු වී සිටියේ මොවුන් ගෙන් 300 ක් පමණ යි.

අද මෙම මී හරකුන් ඒ රටේ අලුත් හරක් වර්ගයක් බිහි කිරීමට පදනම වෙලා. මේ වර්ගයේ සතෙකුගේ 3/8 ක් චාරෝලිස්, 1/4 ක් හෙරිපෝඩ් යන එළ හරක් වර්ගත් සමග බිසන් මී හරකුන්ගෙ 3/8 කුත් එකතු කරලා. අළුතින් ජනනය කළ මෙම හරකුන් වර්ගයේ නම 'බීප්ලෝ'.

මෙම වර්ගය බිහි කරන්න එතරම් පහසු වෙලා නැහැ. මන්දයි කිවහොත් මී හරකුන් එළහරකුන් එකතු වෙලා සාමාන්‍ය යෙන් පැටියෙක් බිහි කරන්න ස්වභාව ධර්මය ඉඩ සලස් වන්නෙ නැති නිසා. එහෙත් විද්‍යාව උපයෝගී කර ගෙන දහස් වාරයක් පමණ මුහුන් කිරීම කරලායි මෙම වර්ගය බිහි කරලා තියෙන්නේ.

බීප්ලෝ හරකෙක් මස් වෙළඳ පොලට යැවීමට පුළුවන් මාස 12 කින්. ඒ වන විට සාමාන්‍යයෙන් උන් කිලෝ ග්රෑම් 455ක් පමණ බර යි. ඒ තරම් ඉක්මනට හැදෙනවා. මේ නිසා මොවුන් ඇමරිකාවේ විතරක් නොවෙයි, මස් උදෙසා හරකුන් ඇති කරන අනෙකුත් රටවලත් ඉතාම ජනප්‍රිය වෙලා. එක් කැලිෆෝනියාවේ බීප්ලෝ බෝ කරන්නෙක් ඔහු ගේ (ප්‍රවේණික පවිත්‍රතාවය) ඇති බීප්ලෝ පට්ටි ගොනෙකුව කැනේඩියානු මස් හරක් ඇති කරන ගොවිපලකට ඩොලර් 2,500,000 කට විකුණලා තිබෙනවා. මෙය ලංකාවේ මුදලින් රු. 20, 000,000 විතර වෙනව

(ඇග්රිකල්චර් යූ එස් ඒ සහරාව)

## මයියොක්කා වලින් ග්ලූකෝස්

මයියොක්කා සහ සෝයා බෝංචි පදනමක වැවූ පුස් වර්ගයකින් නිපදවන ග්ලූකෝමයිලස් නම් එන්සයිම වර්ගයක් යොද මයියොක්කාවල පිෂ්ටය ග්ලූකෝස් වලට පරිවර්තනය කිරීමේ ක්‍රියාවලිය සිදු කල හැක. (දැනටමත් ප්‍රාදේශීය සංවර්ධන මණ්ඩල කිහිපයක් මෙ අයුරින් ග්ලූකෝස් නිපදවීමට කටයුතු කර ගෙන යනු ලැබේ.) මෙම සොයා ගැනීම කරන ලද දේ ලංකා විද්‍යාත්මක හා කාර්මික සංවර්ධන ආයතනය මගිනුයි.

මයියොක්කා සම්බන්ධව දැනට මහජනයා අතර ඇති විවිධ මතවල විද්‍යාත්මක පදනමක් ඇති බව ද සොයාගන තිබෙනවා.

(අ) ඉඟුරු සහ තම්බන ලද මයියොක්කා ආහාරයට ගැනීමෙන් එය ශරීරය විෂ වන බව. මෙහිදී සිදු වන්නේ මයියොක්කාවල ඇතුලත් සයනයිඩ් මුද හැරීමක් සිදුවීමයි. එය ශරීරයට විෂ සහගතය.

(ආ) පරණ වූ මයියොක්කාවල විෂ සහගත බව වැඩියෙන් තිබේය යන මතය සත්‍ය ය.

(ඇ) මයියොක්කා සහ ඉඟුරු විෂවීම වැලැක්වීමට බෙහෙතක් වශයෙන් පේර කොළ යුෂ සුදුසු බව. එයට හේතුව එම යුෂ මගින් මයියොක්කාවල විෂ මැකීමට හැකියාවක් තිබීමයි